


ශ්‍රී. බු. ව. 2555 පොසොන් මස කලාපය, රා. ව. 2011 ක් වූ ජුනි 15 වන දින

වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති
ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

# ඇවිලෙන භව ගිනි නිවමු. !

(සංයුත්ත නිකායෙහි ආදිතත පරියාය සූත්‍රය ඇසුරිනි.)

**ධම්කාමී පින්වතුනි,**

**අද ශ්‍රී සම්බුද්ධ පරිනිර්වාණයෙන් 2555 ක්වූ පොසොන් පුර පසළොස්වක පොහොය දිනයයි. ලෝක ව්‍යවහාර ක්‍රි. ව. ක්‍රමයෙන් 2011 ක් වූ ජුනි මස 15 වන දිනට යෙදුනු පුර පොහෝදිනය යි.**

**ලංකාවාසී ජනතාවට ලොව්තුරා සද්ධර්මයේ ශුභාරංචිය රැගෙන මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන ධම්දූතයන් වහන්සේලාගේ ආගමනය සිදුවූ පොහොය දිනය ලෙසට අද දිනය මහත් අභිමානයකින් සහ ගෞරවයෙන් අපරට වාසීන් සිහිපත් කරති. උන්වහන්සේ අප රටට වැඩම කරන ලද මෙදින දෙවනපෑතිස් මහරජතුමන් ඇතුලු 40000 ක් පිරිසට ''චුල්ලහත්ථි පදෝපම සූත්‍රය'' දේශනා කිරීම ප්‍රසිද්ධ කාරණයකි. ඉන්පසු අරිට්ඨ ඇමති ප්‍රධාන සිංහල පිරිසක් පැවිදිකිරීමෙන් පසු උන්වහන්සේලාට පළමුවෙන් ම දේශනා කළ සූත්‍ර දේශනාව අද මෙහි මාතෘකාව යි.**

මෙම සූත්‍රදේශනාව සූත්‍ර පිටකයේ සංයුත්ත නිකායේ සලායතන වග්ගයේ වේදනා සංයුත්තයට අයත් සූත්‍රයකි. මෙම සූත්‍රයේ නම "ආදිත්ත පරියාය සූත්‍රය" යි. බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේ අමතා "මහණෙනි, තොපට "ගිණි ඇවිලීමක් " පිළිබඳව ධර්‍ම පර්‍යායක් දේශනා කරමි" යනුවෙන් ආරම්භ කරනව.

මහණෙනි, ඇහෙන් රූපයක් දැක එම රූපය කෙරෙහි නිමිති ලබාගෙන ආශ්වාදයෙන් ගැලී ඊට සමගාමීව විඤ්ඤාණය (කුසල් අකුසල් නිසා ඇතිවන ප්‍රතිසන්ධිසිත) පවත්වනවාට වඩා හොඳයි. රත්වීමෙන් ගිනිගෙන දිළියෙන අයශ්ශලාකායෙකින් (යකඩ පතුරකින්) ඇස අතුල්ලා ගැනීම. ඊට හේතුව ඇහෙන් රූපයක් බලා රාග සහිතව විඤ්ඤාණය පැවැත්වීම කළහොත් (තස්මිං චේ සමයේ කාලං කරෙය්‍ය) එහෙම වෙලාවක (ඨාන මේතං විජ්ජති) මෙසේ මෙහෙම සිදුවෙනව, කුමක් ද? (යං ද්වින්නං ගතීනං) එක්කෝ නිරයේ එක්කෝ තිරිසන් ලෝකය නැමති ගති දෙකෙන් එකක උපදිනව. මහණෙනි, මේ දෝෂය දැක මම මෙසේ කියමි.

මහණෙනි , ඇවිලගත් හාත්පසින්ම දිළියෙන ගිනි දැල් සහිත තියුණු උලකින් කණ (සෝතින්ද්‍රිය) අතුල්ලා ගන්න එක, එම කණින් ශබ්දයක් අසා ඒ ශබ්දයට රාගයක් ඇතිවෙලා එම ආශ්වාදය කෙරෙහි මුසපත්ව විඤ්ඤාණය පවත්වනවාට වඩා හොඳයි. ඊට හේතුව වන්නේ ,

එසේ රාගය සහිත විඤ්ඤාණය පවත්වන වෙලාවක මරණය සිද්ධ වුනොත් එක්කො නිරයේ එක්කො තිරිසන් ලෝකයේ උපදිනව. මහණෙනි, මේ අනතුර දැක මම මෙසේ කියමි.

මහණෙනි, ඇවිලගත් හාත්පසින්ම දිළියෙන ගිනි දැල් සහිත තියුණු (නිඛාදනෙන) නියනකින් (හාරන ආයුධය) ඝානින්ද්‍රිය (නැහැය) ගලවා දමන්න. නැහැයෙන් දතයුතු ගන්ධයන්හි (ගඳ සුවඳ) ආඝ්‍රාණය කරද්දී රාගය හෝ අමනාප ගැටීමක් ඇති වුනොත් ඉන්පසුව ක්‍රියාත්මක විඤ්ඤාණයෙන් යුතුව පවතින වෙලාවක මරණය සිදුවුවහොත් නිරයේ උපදිනව. එම ආස්වාදයේ විඤ්ඤාණ මුසපත් භාවය නිසා තිරිසන් අපායේ උපදිනව. මෙසේ වූ අනතුරක් වේ නම් එම දෝෂය දැක මම මෙසේ කියමි.

මහණෙනි, දිවට රස දැනෙනවා. එම රසයට ගිජු වී විඤ්ඤාණය පැවැත්වීමට වඩා හොඳයි රත් වූ ගිනිගත් දිළිහෙන දැලිපිහියකින් (බුරෙන) ජිව්හින්ද්‍රියය (දිව) කපා දමන්න.

ඊට හේතුව ? දිවට දැනෙන රසයට ඇලුනාවූ විඤ්ඤාණයෙන් යුතුව වාසයකිරීමක් කරද්දී මරණයට පත්වුවහොත් නිරයේ හෝ තිරිසන් අපායෙ උපදිනවා. එසේ එය සිදුවන්නේ මයි එම දෝෂය දැක මම මෙසේ කියමි.

මහණෙනි, කයට (ශරීරයට) ස්පර්ශය දැනෙනවා. එසේ ලැබෙන්නා වූ පහස සුඛාස්වාදය හේතුකොට ඇතිවන්නා වූ ගිජුකම නිසා ඇතිවන විඤ්ඤාණය පැවැත්වීමට වඩා හාත්පස රත්වූ ගිනි දැල් සහිත තියුණු ආයුධයකින් සැතකින් (සත්තියා) කායින්ද්‍රිය (ශරීරය) සැස දමන ලද්දේ වීනම් හොඳයි. එසේ කය පිළිබඳ නිමිත්තාස්වාදයෙන් (නිමිතතසසාද ගථිතං) බැඳුනාවූ අනුව්‍යඤ්ජනාස්වාදයෙන් බැඳුනු විඤ්ඤාණයක් පවත්වද්දී මරණය සිදුවුවහොත් නිරයත් තිරිසන් අපායත් යන ගති දෙකින් එකකට පැමිණෙන බැවිනි. එසේ වූ දෝෂයක් මම බුදු නුවණින් දකිමි. දැක පවසමි.

මහණෙනි, ඇහැ ඇරගෙන ඉන්න අවස්ථාවන්හි දී අකුසල් සිතුවිලි කල්පනාවට ගෙන ඉන්නවාට වඩා අසමගිය ඇතිවන බිඳවන කඩාකප්පල් වන දේවල් කල්පනා කර කර ඉන්නවාට වඩා නිදාගන්න එක හොඳයි. ඒත් මහණෙනි, නින්දට බැස ගැනීම ජීවිත ඵල රහිත වීමකි. වඳබවකි. මුලා වීමකි. නමුත් ඒක හොඳයි. ඇහැඇරගෙන අකුසල් විතර්ක උපදිනවාට වඩා ඊට හේතුව වන්නේ එසේ අකුසල විඤ්ඤාණයන් පවත්වද්දී මරණය සිදුවුවහොත් දුගති ගාමීවීම සිදුවන නිසා ය.

මෙසේ බුදුහිමියන් ඉහත කී පරිදි ඇස ගැන (චක්ඛු) කණ ගැන (සෝත) නාසය ගැන (ඝාණ) දිව ගැන (ජිව්හා) කය ගැන (කාය) මනස ගැන (මන) යන ආයතන හයම සම්බන්ධකරල එහි ආදීනව පැහැදිලි කරනවා.

ඉන්පසු උන්වහන්සේ මේ අනතුර අශ්‍රැතවත් පෘථග්ජනයාට ඇතිවන්නක් බව දේශනා කරනව. අශ්‍රැතවත් පෘථග්ජනයා යනු ආර්‍යයන් නොදැක්ක (අරියානං අදස්සාවි) ආර්‍ය ධර්මයෙහි අදක්ෂ (අරිය ධම්මස්ස අකොවිදො) ආර්‍ය ධර්මයෙහි නොහික්මුණු (අරිය ධමෙම අවිනීතො) සත්පුරුෂයන් නොදුටු (සප්පුරිසානං අදස්සාවි) සත්පුරුෂ ධර්මයෙහි අදක්ෂ (සපපුරිසධමමසස අකොවිදො) සත්පුරුෂ ධර්මයෙහි නොහික්මුණ (සපපුරිස

ධමෙම අවිනීතො) පුද්ගලයා ය. මෙසේ වූ පුද්ගලයා මේ අනතුර හඳුනන්නේ නැහැ.

ශ්‍රැතවත් ආර්‍යයා ශ්‍රාවකයා ඉහත කී දුර්වලතා ඇත්තෙක් නොවෙයි. ඔහු ආර්‍යයන් දකින (අරියානං දස්සාවි) ආර්‍ය ධර්මයෙහි දක්ෂයි. ( (අරිය ධමමසස කොවිදො) ආර්‍ය ධර්මයෙහි හික්මුණු කෙනෙකි. (අරිය ධමෙමසුවිනීතො) සත්පුරුෂයන් දකී (සපපුරිසානං දසසාවි) සත්පුරුෂ ධර්මයෙහි දක්ෂයි. (සපපුරිස ධමමසස කොවිදො ) සත්පුරුෂ ධර්මයෙහි හික්මෙයි. (සපපුරිස ධමෙම සුවිනීතෝ)

ශ්‍රැතවත් ආර්‍යයා ශ්‍රාවකයා ඉහත කී අනතුර මෙසේ නුවණින් දැන නුවණින් දකිනව. ඇවිලගත් හාත්පසින්ම දිළියෙන ගිනිදැල් සහිත රත්වූ යකඩ පතුරකින් ඇහැ හූරා අතුල්ලා දමනවාට වඩා ඉති චකඛුං අනිචචං (ඇස අනිත්‍යයි) රූපා අනිචචා (රූප අනිත්‍යයි) චකඛු විඤ්ඤාණං අනිචචං (ඇසේ විඤ්ඤාණය අනිත්‍යයි) චකඛුසමඵසෙසා අනිචෙචා (ඇසේ ස්පර්ශය අනිත්‍යයි) යම පිදං චකඛු සමඵසස පචචයා උපප ජජති වෙදයි තං සුඛංවා දුකඛංවා අදුකඛමසුඛංවා තමපි අනිචචං (ඇසේ ස්පර්ශයෙන් හටගන්නා වූ යම් සැපක් දුකක් උපේක්ෂාවක් ඇත් ද. එය අනිත්‍යයි)

එසේ සිතමින් ඇසේ විඤ්ඤාණයේ නිමිත්තේ ආශ්වාදයට ගිජුවීමේ ස්වභාවය හීනවී නැති වී යනතුරු නුවණින් මෙනෙහි කරනවා. එසේ අනිත් ආයතන පහ පිළිබඳවත් සිතනවා.

* කණ අනිත්‍යයි (ස්ථිර නැත), ශබ්දය අනිත්‍යයි , කණෙහි විඤ්ඤාණය අනිත්‍යයි , කණෙහි ස්පර්ශය අනිත්‍යයි , සපර්ශයෙන් හටගන්නා විඳීම අනිත්‍යයි .

* නාසය අනිත්‍යයි, ගඳ සුවඳ අනිත්‍යයි, නාසයේ විඤ්ඤාණය අනිත්‍යයි, නාසයේ ස්පර්ශය අනිත්‍යයි , ස්පර්ශයෙන් හටගන්නා විඳීම අනිත්‍යයි .

* දිව අනිත්‍යයි, රසය අනිත්‍යයි, දිවේ විඤ්ඤාණය අනිත්‍යයි, දිවේ ස්පර්ශය අනිත්‍යයි , ස්පර්ශයෙන් හටගන්නා විඳීම අනිත්‍යයි .

* කය අනිත්‍යයි, එහි පහස අනිත්‍යයි, කයේ විඤ්ඤාණය අනිත්‍යයි ,කයේස්පර්ශය අනිත්‍යයි , එයින් හටගන්නා විඳීම අනිත්‍යයි .

* මනස අනිත්‍යයි, අරමුණු අනිත්‍යයි, මනසේ විඤ්ඤාණය අනිත්‍යයි, මනසේ ස්පර්ශය අනිත්‍යයි , ස්පර්ශයෙන් හටගන්නා විඳීම අනිත්‍යයි .

ඉහත කී ධර්ම පර්යායට අනුව කටයුතු කිරීමෙන් අනිත්‍ය මෙනෙහි කිරීමෙන් ඇස ආදී ආයතන හයෙහි කළකිරේ. එම ඉන්ද්‍රියට ගොදුරුවන අරමුණු කෙරෙහි කළ කිරෙයි. එම විඤ්ඤානයන් කෙරෙහි කළ කිරෙයි. එම ස්පර්ශයන් කෙරෙහි කළ කිරෙයි. එයින් ඇතිවන වේදනාව කෙරෙහි (දැනීම) කළ කිරෙයි. එවිට ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය වැඩෙනව එවිට සීල, සමාධි, ප්‍රඥා සංඛ්‍යාත ත්‍රිශික්‍ෂාවේ හික්මෙනව කළකිරීමෙන් ඇල්ම පහවෙනවා ආයතන හයේම නුවණ මෙහෙයවා හික්මීමෙන් කලකිරෙනුයේ දුක කෙරෙහිමය. නිවැරදි දැක්මක් ඇතිවෙනවා.

කතමඤ්චාවුසෝ සම්මාදිට්ඨි? දුක්ඛෙ ඤාණං, දුක්ඛ සමුදයේ ඤාණං. දුක්ඛ නිරොධෙ ඤාණං දුක්ඛ නිරොධ ගාමිණියා පටිපදාය ඤාණං" මහණෙනි !, සම්‍යක් දෘෂ්ඨිය කවරෙක් ද? දුක කෙරෙහි මේ දුකය යි , දැනේ ද? දුක්ඛ සමුදය කෙරෙහි මේ දුක් ඉපදීම යන දැනීමක් වේද, මේ දුක් නැතිවීමය යන දැනීමක් වේද දුක් නැති කිරීමට මේ පිළිපැදීමය යන දැනීමක් වේද එය නිවැරදි දර්ශනය යි. දුක හටගැනීමේ හේතුව නැතිවෙනවා. (නිබ්බිදං විරජ්ජති) කළකිරීමෙන් නොඇලේ, නොඇල්මෙන් නිදහස් වේ. නිදහස් වීමෙන් මිදුනු බව දැනෙනවා. අවබෝධය ඇතිවෙනවා. (විමුත්තසමිං විමුත්තමහි ඤාණං හොති) ජාතිය ක්‍ෂය වෙයි. නැවත ඉපදීම නිමවේ. එසේ වූ පුද්ගලයාට ඒ නිවන් මග ඒ ජීවිතය තුළ දීම සම්පූර්ණ වෙනවා.

මෙසේ සාමාන්‍ය තත්වයෙන් ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය සම්පූර්ණ වුනා කියා අත්දැකීමක් ඇතිවීමට සද්ධානුසාරී වෙනවා. යනුවෙන් දැනගත යුතුයි . තවදුරටත් ගැඹුරින් අත්දැකීම ඇතිකර ගැනීම ධම්මානුසාරී වීමයි. ඇතිතතු එසේ දැන ගැනීම සෝතා පන්න වීමයි. ඊටත් ගැඹුරින් තව අත්දැකීම සකෘදාගාමී වීමයි. තවත් ගැඹුරින් දැකීම අනාගාමී වීමයි. සම්පූර්ණ වශයෙන්ම දැකීම අරහත් ඵලය යි.

ඒ පිළිබඳව ''ඛීණා ජාති වුසිතං බ්‍රහමචරියං'' (ජාතිය ක්ෂයවී බඹසර වැස නිමවිය.) යනුවෙන් තථාගතයන් වහන්සේ දේශනාව අවසන් කරනව.

අද පොසොන් පුර පසළොස්වක් පෝය දවසේ බුදුපියාණන් වහන්සේ මෙන්ම ත්‍රිවිධ රත්නයම මෙනෙහි කොට ආමිස ප්‍රතිපත්තීන් හි යෙදෙනවා. අපි මිහිඳුමහරහතන් වහන්සේට අනුබුදු නාමයෙන් ගෞරව සම්මානනාදිය වචනයෙන් ද දක්වමින් උන්වහන්සේ ද සිහිපත් කරනව. ඒ සමගම අපිදු විශේෂයෙන් ''ආදිත්ත පරියාය සූත්‍රයට'' අනුව ඉගෙන ගත යුතුයි. ඒ අනුව හැසිරීමට උත්සාහගත යුතුයි.

මිහිඳු මහරහතන් වහන්සේ අප රටට වැඩම කරන ලද්දේ මෙම රටේ ඇති සශ්‍රීකත්වය හෝ සිව් පසය දීමට මනුෂ්‍යයින් සිටින නිසා එය ලබා ගැනීමේ ගිජුකමට වත් නොවේ. බොහෝ කලක් මෙරටෙහි බුදු දහම නිමලව පවතින බව එවකට වැඩ සිටි මොග්ගලී පුත්ත තිස්ස මහරහතන් වහන්සේ අශෝක අධිරාජයාට ද නිතර ප්‍රකාශ කළ හෙයින් ය. මිහිඳු මහරහතන් වහන්සේ තම ජීවිත කාලය මෙහිම වැඩ සිටියේ බුද්ධ වචනයට අනුවයි. සූත්‍ර දේශනයට අනුව අපරට වැසි ජනතාවගේ කෙළෙස් දාහය නිවීමටයි. එයින් මුදවා ගැනීමට යි. මහා කරුණාවෙනි. එදා පටන් ආර්‍යයන් වහන්සේලාගේ ආභාෂය අප ජනතාවට ලැබුනා. මේ සූත්‍ර දේශනාව උන්වහන්සේ අප රටේ සිංහල භික්ෂූන් වහන්සේලාට දේශනා කළේ විශේෂයෙන් ආර්‍ය සත්පුරුෂ ආශ්‍රයේ අගයත් එයින් පරමාර්ථධර්මය මුදුන්පත් කරගැනීමට පහසුවටත් ය.

අප සිහිනුවණින් ජීවිත පවත්වන මේ වෙලාවේ උතුම් මිනිස්කම පවතිද්දී මෙම සූත්‍රයේ හරය ඉගෙන ටික ටික හෝ දියුණු කළ යුතුයි. ඒ සඳහා භේදයක් නැහැ. ගිහි පැවිදි හෝ දුප්පත් පොහොසත් හෝ උගත් නූගත් හෝ කුල හීන කුලයෙන් උසස් හෝ වෙනසක් අවශ්‍ය වෙන්නෙ නැහැ ඊට හේතුව. ඒ හැමටම දුක ලෝක සාධාරණ නිසා ය.

තිසරණයේ පිහිටල අප අප විසින්ම නැගී සිටිය යුතුයි. නිතරම උතුම් වූ සත්‍ය සතර තුළ වාසය කළ යුතුයි. අටලෝ දහමින් කම්පා නොවීමට උත්සාහ වෙර වැඩිය යුතුයි. ඒ සඳහා මිහිඳු මහරහතන් වහන්සේ අපිට දේශනා කල මෙම සූත්‍ර ය බුදු හිමියන් දේශනා කළ ශ්‍රී සද්ධර්මයමයි. ඒ සමගම අප නිවෙස්වල කුඩා දරුවන් වුවද මිහිඳු

මහරහත් මා හිමියන්ට දිවා රෑ නමස්කාර කිරීමට හුරුපුරුදු කළ යුතුයි. ගුණ සිහිපත් කිරීමට ද හුරු පුරුදු කළ යුතුයි. එවිට ආයර්‍යයන්වහන්සේලා හඳුනා ගැනීමට ශ්‍රද්ධාවක් ඇතිවෙනවා. කුඩා කළ පටන් ඔවුන් අසරණ භාවයට පත්වෙන්නේ නැහැ. මිනිස් අපරාධ කරුවන් බිහිවන්නේ නැත. සද්ධර්මය හඳුනා ගන්නව. ලෝකයේ ඉහළම තලයට ගිය මහා ප්‍රසිද්ධ උගත් පුද්ගලයින් නායකයින් ඇස කණ නාසය ආදී ඉන්ද්‍රිය සංවරයෙන් යුක්තව කටයුතු නොකිරීමෙන් ලබා ගන්නා වූ අරමුණු මගින් මුසපත් වෙනවා. තම තරාතිරම දන්නේ නැහැ. ඉන්නෙ කොතැන ද දන්නේ නැහැ . මුසපත් වූ අරමුණු තුළ විඤ්ඤාණය පවතිනව. එයින් තීරණ දෙකකට පමණක් එන බව සූත්‍රයේ දැක්වෙනවා. එක්කෝ නිරයේ එක්කෝ තිරිසන් යෝනියේ එතනයි අනතුර අවදානම පවතින්නේ මේ තත්වය නුවණින් දැක සද්ධර්මයෙන් බැහැර නොවිය යුතුයි. ඉහත කී පරිදි කොහොම හරි පංචඉන්ද්‍රියයන් වැරදි ලෙස භාවිතා කරල මුදල් ටිකක් හොයාගත්තට තනතුරු ලබාගත්තට සුවපත් වෙන්න බැහැ. ඉහත අනතුරින් මිදෙන්නට බැහැ.

පසුගිය දිනක ලෝකයේ එක්තරා ප්‍රධාන මූල්‍ය ආයතනයක ප්‍රධානියෙකු හැඟීම් වලට වහල් වීමෙන් කයෙහි පහසෙහි එම විඳීමෙහි ආදීනව අනියත බව පිළිබඳව මොහොතක් නොසිතීමෙන් අපකීර්තියට සහ නීතියේ රැහැනට හසුවී ක්ෂණයෙන් මුලු ලෝකයටම දැනගන්නට ලැබුන එම සිද්ධිය මුදලින් යටපත් කරන්න බැහැ. ඒ අපිට, පෙනෙන විපාකය යි. ඉහත කී ගති දෙකේ උප්පත්තිය ලැබුනොත් එහි දුක සීමා කරන්න බැහැ. අපත් අපේ සසර එලෙසින් අප සමග එකට සිටි අය කොපමණ අද ඒ අනතුරට වැටී ඇත් ද එය අපිට නොපෙනේ. ඒ තත්වය දැකීමේ නුවන උපදවාගත් භාග්‍යවතුන් වහන්සේ "සත්ථා දේව මනුස්සානං" අපගේ ශාස්තෘවරයාගේ ඒ අණට කීකරුවෙමු . නුවණින් ලෝකය දැකීමට අසාර වූ බඹයක් පමණ ශරීරයම උපයෝගී කර ගනිමු. එම කෙළෙස් ගිනි නිවීමට පොසොන් උදාව උපයෝග කර ගනිමු.

සැමට සිත් ගිනි නිවා ගැනීමට ප්‍රඥාව පහළ වේවා ... !!!

**තෙරුවන් සරණයි !**

**www.lakruhunu.com**